**ශ්‍රී ලංකාවේ කැනොයින් සහ කයාකින් සඳහා ජාතික සංගමය - 2022**

**------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාචනය**

ශ්‍රී ලංකාවේ කැනොයින් සහ කයාකින් සඳහා ජාතික සංගමයේ ("සංගමය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ආදායම | 1,203,394 | ලදු පත් | ප්‍රමාණවත් පිළිතුරක් සංගමය විසින් ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම, වියදම් සහ ශේෂය සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන සපයා තිබිය යුතුය |
| (ආ) වියදම් | 2,173,171 | ගෙවීම් වවුචර | -එම- | |
| (ඇ) බැංකු | 675,493 | බැංකු සැසඳීම් ප්‍රකාශන සහ තහවුරු කිරීම් | -එම- | |

#### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වසරේ පස්වන ඔරු පැදීමේ ජාතික ශුරතාවලිය Regatta 2021 සඳහා වැය වූ මුදල රුපියල් 183,000ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සටහන් කර ඇති බැවින් වර්ෂය තුළ අලාභය එම ප්‍රමාණයෙන්ම වැඩි වී ඇත. | මේ වැඩසටහන සඳහා 2021 වසරේදී දරන ලද වියදම් 2022 වසරේදී වාර්තා කරන ලදී. | මූල්‍ය ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

### 1.5.2 මූල්‍ය ප්‍රකාශන සැකසීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ මුදල් පොත, පොදු ලෙජරය සහ ශේෂ පිරික්සුම විගණනය සඳහා ලබා දී නොතිබුණි. | සංගමය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු පොත් සහ ලෙජර නොමැත. | මුදල් පොත, පොදු ලෙජරය සහ ශේෂ පිරික්සුම සංගමය විසින් විගණනය සඳහා සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනයක් සංගමය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර ඉදිරිපත් කරයි. | ස්ථාවර වත්කම් ලේඛනය සංගමය විසින් නිසි ලෙස සකස් කළ යුතුය. |
| (ඇ) සංගමයේ 2022 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන මසක ප්‍රමාදයකින් යුතුව 2023 මාර්තු 30 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. | සංගමය විසින් 2023 මාර්තු 30 වැනි දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී. | මූල්‍ය ප්‍රකාශය ප්‍රමාදයකින් තොරව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය |
| (ඇ) සංගමය විසින් ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කර නොතිබුණි | සංගමය විසින් සකස් කරන ලද අයවැය සහ ක්‍රියාකාරී සැලැස්මක් නොමැත. | නිසි අයවැය සහ ක්‍රියාකාරී සැලැස්මක් සංගමය විසින් සකස් කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 969,777 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 311,893 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 657,884 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු වියදම් රු. 1,424,032 කින් වැඩි වීම මෙම පිරිහීමට හේතු විය.